# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2060/21 - 2018 පෙබරවාරි මස 28 වැනි බදාදා - 2018.02.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : BKP/LAND/ACQUI/A3/19.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/15/2016/VE/299.

බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 2016 නාය යාමෙන් අවතැන් වූ ජනතාව නැවත පදිංචි කිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම උඟුරුමීවල වත්ත වාගොල්ල කොටස නැමැති ඉඩම අමුණා ඇති උපලේඛනයේ සඳහන් ඉඩම් කැබලි අත්පත් කරගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 128 බී දරන වැගල්ල ග්‍රාම නිලධාරි වසමේ වැගල්ල ගම තුළ පිහිටි කෑගල්ල මැනුම් අධිකාරියේ අංක මු.පි.කැ. 3569 දරන මූලික පිඹුරේ අමුණා ඇති උපලේඛනයේ සඳහන් ඉඩම් කැබලි 3 ක් වේ.

*වන්දි හිමිකම් පරීක්ෂණ දිනය :*

**මු.පි.කැ. 3569 පිඹුරේ කැ. අංක 01 - 03 සඳහා 2018 මාර්තු 13 වෙනි දින පෙ. ව. 10.00 ට**

කැබලි අංකය : 01- 03
ප්‍රමාණය : හෙක්. 2.3540
ඉඩමේ නම : *උඟුරුමීවල වත්ත (වාගොල්ල කොටස)*
හිමිකම් පාන්නන්ගේ නම සහ ලිපිනය :
01. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, කොළඹ.
02. කළමණාකරන අධ්‍යක්ෂ, කැළණිවැලි වැවිලි සමාගම, 400, ඩීන්ස් පාර, කොළඹ 10.
03. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, දෙවන මහල, සෙත්සිරිපාය දෙවන අදියර, බත්තරමුල්ල.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ ඉහත සඳහන් දිනයන් හි හා



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

වෙලාවන් හිදි බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2018 මාර්තු මස 10 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම අත්පත් කර ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ජේ. එම්. රම්‍යා ජයසුන්දර,
ප්‍රාදේශීය ලේකම්,
බුලත්කොහුපිටිය.

2018 පෙබරවාරි මස 26 වැනි දින,
බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

03 - 639

---

## ශුද්ධි පත්‍රිකාවයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1909/40 හා 2015.04.08 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ඉඩම් අත්පත් කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය) 7 වැනි වගන්තිය යටතේ දැන්වීමෙහි ර.306 මූලික පිඹුරේ කැබලි අංක 22 හි ප්‍රමාණය හෙක්. 0.1109 ක් ලෙස ද, කැබලි අංක 23 හි ප්‍රමාණය හෙක්. 1.0451 ක් ලෙස ද සංශෝධනය කරමි.

අයි. ආර්. එම්. ප්‍රදීපිකා ඩී. ඉළුක්කුඹුර,
ප්‍රාදේශීය ලේකම්,
රත්නපුර.

2018 පෙබරවාරි මස 23 වැනි දින දීය.

03-640

---

## ශුද්ධි පත්‍රිකාව

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි**
**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වෙනි වගන්තිය යටතේ දැන්වීමයි.

*මගේ අංකය :* එම්එල්බී/එල්එන්ඩී/එල්එන්ඩීඒකිව්/එල්1/39-6-i
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය :* 4-3/2014/එච්ඩබ්ලිව්/405

මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් දීපිකා කුමාරි ගුණරත්න වන මම දක්ෂිණ අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ අතුරු මාර්ග ඉදිකිරීමට අදාළව නිකුත් කරන ලද 2017.11.30 දිනැති අංක 2047/42 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* ප්‍රකාශයට පත් කරන ලද 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 7 වන වගන්තිය යටතේ *ගැසට්* නිවේදනයේ සඳහන් **වන්දි පරීක්ෂණ දිනය 2018.03.26 වන දින** ලෙස සංශෝධනය කරන ලද බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

දීපිකා කුමාරි ගුණරත්න
ප්‍රාදේශීය ලේකම්,
මාලිම්බඩ.

2018 පෙබරවාරි මස 15 වැනි දින
ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය,
මාලිම්බඩ.

03 - 641

---

## ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය:* ම/සං/ඉ/3/සීඊපී/කි.මී.1.0-කි.මී.2.0
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය :* 4-3/7/2016/එච්ඩබ්ලිව්/280

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඉහල කරගහමුණ ගමේ, අංක 248බී, ඉහළ කරගහමුණ නැගෙනහිර ග්‍රාම නිලධාරි වසමේ සහ අධිකාරි පත්තුව සුළු කොට්ඨාසයේ පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවෙන් ගම්පහ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද මූලික පිඹුරු අංකය ගම් 4038 හි කැබලි අංක 15, ඉඩම් කොටස සංශෝධනය වී කැබලි අංක 52 හා 53 ලෙස පහත සඳහන් පරිදි කොටස්වලට බෙදී ඇත.

01. **කැබලි අංක 52**
ඉඩමේ නම: ගල්පොත්ත කුඹුර; ඉඩමේ විස්තරය: වත්ත, අවුරුදු 7ක් පමණ වයසැති කොස් ගසක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: එම්. පී. බී. ලීලාරත්න, අංක 356, රාජසිංහ මාවත, ඉහල කරගහමුණ, කඩවත, (15 වැනි බිම් කැබැල්ලේ කොටසක්, අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා); ප්‍රමාණය: හෙක්. 0.0102.

02. **කැබලි අංක 53**
ඉඩමේ නම: දොඹගහවත්ත; ඉඩමේ විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: එම්. පී. බී. ලීලාරත්න, අංක. 356, රාජසිංහ මාවත, ඉහල කරගහමුණ, කඩවත, (15 වැනි බිම් කැබැල්ලේ කොටසක්, අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා); ප්‍රමාණය:හෙක්. 0.0050.

ජී. එස්. අයි. විමලසේන,
ප්‍රාදේශීය ලේකම් හා අත්කර ගැනීමේ නිලධාරි
මහර.

2018 ජනවාරි මස 23 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මහර.

03-642

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.